




# Saw the world through you!

# ඔබේ ඇසින් ලොව දුටුවෙමි!

Two men, both seriously ill, occupied the same hospital room. One man was allowed to sit up in his bed for an hour each afternoon to help drain the fluid from his lungs. His bed was next to the room's only window. The other man had to spend all his time flat on his back.

The men talked for hours on end. They spoke of their wives and families, their homes, their jobs, their involvement in the military service, where they had been on vacation.

Every afternoon when the man in the bed by the window could sit up, he would pass the time by describing to his roommate all the things he could see outside the window.

The man in the other bed began to live for those one-hour periods where his world would be broadened and enlivened by all the activity and colour of the world outside.

The window overlooked a park with a lovely lake. Ducks and swans played on the water while children sailed their model boats. Young lovers walked arm in arm amidst flowers of every colour and a fine view of the city skyline could be seen in the distance.

As the man by the window described all this in exquisite detail, the man on the other side of the room would close his eyes and imagine the picturesque scene.

One warm afternoon the man by the window described a parade passing by.

Although the other man couldn't hear the band, he could see it. In his mind's eye as the gentleman by the window portrayed it with descriptive words. Days and weeks passed.

One morning, the day nurse arrived to bring water for their baths only to find the lifeless body of the man by the window, who had died peacefully in his sleep. She was saddened and called the hospital attendants to take the body away.

As soon as it seemed appropriate, the other man asked if he could be moved next to the window. The nurse was happy to make the switch, and after making sure he was comfortable, she left him alone.

Slowly, painfully, he propped himself up on one elbow to take his first look at the real world outside. He strained to slowly turn to look out the window beside the bed.

It faced nothing but a blank wall.

When the nurse came to the room, the man asked her what could have compelled his deceased roommate to described such wonderful things outside the window. The nurse responded that the man was blind and could not even see the wall.

She said, "Perhaps he just wanted to encourage you... Keep you happy.... He was a terminally ill patient. He too knew, he wouldn't last long. What he did was a truly great thing, I suppose. "

The nurse left the room. Tears welled in his eyes that trickled down on to the pillow. He tried to remember dead friend's voice.

බලවත් ලෙස රෝගාතුර වූ මිනිසුන් දෙන්නෙක් රෝහලක වාට්ටු කාමරයක ප්‍රතිකාර ලබමින් සිටියා. නර්ස් කෙනෙක් ඇවිත්, ඒ එක් මිනිසෙක් දවසට පැයක් හැන්දෑවෙ ඇඳේ කෙලින් කරලා වාඩිකරවනවා ඔහුගෙ පෙනහැල්ලේ පිරුණු වතුර ඉවත්කරන්න. ඔහුගේ ඇඳ තිබුණේ ඒ කාමරේ වූ එකම ජනේලෙ ගාව.

අනෙක් රෝගියාට නැගිටින්න බැහැ. ඔහු මුළු කාලයම ගත කළේ ඇඳේ මුනින් තලව් වෙලා වැතිරිලා. ඒත් මේ ලෙඩ්ඩු තමන්ගෙ පවුල්වල විස්තර. කරපු රස්සා වල් ගැන. යුද්ධ සේවයට ගිහිං වෙච්ච රසවත් සිද්ධි. ඔය ආදී නොයෙක් දේවල් ගැන දිගට කතා කළා.

හැමදාම හවස නර්ස් ඇවිත් ජනේලෙ ළඟ ඉන්න පුද්ගලයා උස්සලා ඇඳේ වාඩි කරවලා ගියාම, මිනිහ කරන්නේ තවත් ටිකක් ඉස්සිලා, ජනේලයෙන් එළිය බලනවා. බලලා, ඒ ජනේලෙන් එළියෙ පෙනෙන දේවල් විස්තර ඇතුව අර අනික් ඇඳේ මුනින් තලව් වෙලා ඉන්න හාදයට කියනවා.

එයා ඒව අහලා ඒ පැය ඇතුළත එළියෙ සිද්ධ වෙන දේවල් ගැන හොඳ පැහැදිලි රූපයක් හිතේ මවා ගන්නවා, හරියට ඒ දේ තමනුත් ඇහින් දකිනවා වගේ. මේ විදියට හැමදාම වුණා.

ඒ ජනේලෙන් පෙන්නෙ මදක් ඈත පාක් එකක් (උද්‍යානයක්) ඒ පාක් එක ඉදිරියෙ ජලය හොඳට පිරුණු සුන්දර වැවක්. වැවේ හංසයන්, තාරාවන් සහ දියකාවන් පිහිනා යනවා. කුඩා ළමයි කුඩා සෙල්ලම් බෝට්ටු පාකරලා යවනවා. ඒ ළමයින්ගෙ අම්මා සැරින් සැරේ දරුවන්ට අවවාද කරනවා පරිස්සම් වෙන්න කියලා. ඇය එතනම බංකුවක වාඩිවෙලා සඟරාවක්ද කොහෙද කියවනවා. වැව ඉවුරේ වටේ ලස්සනට ඩැපඩිල් මල් පිපිලා. තරුණ පෙම්වතුන් ජෝඩුවක් හිනාවෙමින්, පෙම්-බස් කොඳුරමින් දෑත් පටලවාගෙන ඇවිදිනවා. අහසේ දේදුන්නක් පායාගෙන එනවා.

මේ සුන්දරත්වය බිඳක් හෝ අත නැර ජනේලය ළඟ එබී ඒවා දෙස බලා සිටින පුද්ගලයා විස්තර කරද්දී කාමරයේ අනෙක් කෙළවරේ සිටින ලෙඩා දෑස් පියාගෙන එයට සවන් දෙමින් එම වෛවර්ණ ලෝකය සිතේ ජීවමානව මවාගත්තා.

එක් උණුසුම් සවසක ඒ උද්‍යානය හරහා සොල්දාදුවන් කණ්ඩායමක් අලංකාර නිල ඇඳුම් වලින් සැරසී පා ගමනේ ගියා. ඉදිරියේ බෑන්ඩ් එකක් වාදනය කළා. කාමරේ ඇතුළේ ඇඳ මත දිගාවූ ලෙඩාට හමුදා කණ්ඩායම නොපෙනුණත්, බෑන්ඩ් එකේ වාදනය නෑසුනත් ඔහු හිතින් ඒ සියල්ල මනාව චිත්‍රණය කළා.

සති පහුවෙලා ගියා. දවසක් උදේ සාත්තු සේවිකාව කාමරේට ආව ලෙඩුන් දෙන්නාගෙ මූණ සෝදන්න. එතකොට තමයි දැක්කෙ ජනේලය ළඟ සිටි කෙනා නින්දෙන්ම මියගොස් ඇති බව. ඔහුගේ මුහුණේ ශාන්ත පෙනුමක් ද තිබුණා. ඇයට හරි කණගාටුයි. රෝහලේ සේවකයන් මියගිය රෝගියා ඇඳෙන් ඉවත්කර ඉවත අරගෙන ගියා.

කාමරේ දැන් තනියම ඉන්න අනෙක් ලෙඩා නර්ස්ට කිව්වා කලින් යාළුවා හිටි ජනේලෙ ළඟ ඇඳට තමා දාන්න කියලා. සාත්තු සේවිකාව තව අයගේද උදව් ඇතිව ඔහු ඔසවා ඒ ඇඳේ තැබුවා.

ටික වෙලාවකින් ඔහු ඒ ඇඳෙන් ඉතා අමාරුවෙන් ඉදිරියට ඇදී එසවී ජනේලයෙන් එළියට එබුණා, මෙපමණ දිනක් ඒ මියගිය යාළුවාගෙන් විස්තර පමණක් අසා තිබූ ඒ පිටස්තර සුන්දර උද්‍යානය ප්‍රථම වරට සියැසින් දකින්න.

ඔහු දුටුවෙ අඳුරු පාට තාප්පයක් විතරයි. වෙන කිසි දෙයක් නෑ. ඔහුට අදහගන්න බැරිවුණා. කෝ අර කියාපු උද්‍යානය ? කෝ වැව? කෝ අර පීනපු හංසයන් හා වැව ඉවුරේ ඇවිද ගිය මිනිස්සු ? කෝ මෙපමණ දවසක් තමා මනසින් දුටු ඒ සුන්දර ලෝකය ?

එදා සාත්තු සේවිකාව ආ විට ඔහු ඇයගෙන් ඇහුවා, ඇයි ඒ මැරුණු යාළුවා අර තරම් විස්මිත, අලංකාර විදියට පිටත දේවල් විස්තර කළේ? කියලා. ඔහුට තවත් පුදුම හිතුනා ඇය කිව්වම ඒ මැරුණු තැනැත්තාට කොහෙත්ම ඇස් නොපෙනුණු බව. ඔහු අන්ධයෙක් බව. උද්‍යානයක් තියා ඒ ජනේලය ඉදිරියේ ඇති තාප්පයවත් නොදුටුව බව.

ඇය මෙහෙම කිව්වා. " මං හිතන්නෙ ඔහුට ඕනෑ වුණේ ඔබ සංතෝෂයෙන් තියන්න. ඔහුගේ ලෙඩේ හැටියට ඔහු කොයි මොහොතේ හෝ මියයන බව අප දැනසිටියා. ඔහුත් එය දන්නවා. ඒත් ඒ කිසි දෙයක් අඟවන්නෙ නැතුව ඔහු ඒ සියලු දේ මනසින් හිතා හරියට දකිනව වගේ ඔබට විස්තර කළේ ඉන්න ටික දවසට හරි ඔබව සතුටින් තියලා යන්න. කිසිසේත් ඔබව රවටන්න හිතලා නෙවෙයි. ඒක මනුෂ්‍යත්වයේ උතුම් දුර්ලභ ගුණයක්. මට හිතෙන්නෙ එහෙමයි."

සාත්තු සේවිකාව කාමරයෙන් පිටවී ගියා. ඔහුගෙ ඇස්වලට කඳුළු පිරෙමින් තිබුණා. ඒ කඳුළු මුහුණ දිගේ කොට්ටයට ද බේරුණා. ඔහු මහන්සි ගත්තා මැරුණු ඒ යහළුවගෙ කටහඬ මතක් කරන්න.

♦ දීපා සඳමාලි හේරත් Deepa Sandamali Herath - USA